
# ලන්ඩන් කවි
# LONDON KAVI

2 Queens Parade, Green Lanes, London, N8 0RD
Tel: 020 8347 6211, Fax: 020 8341 5905, Email: kavi@londonkavi.com
Free Circulation - Vol 2 Issue1 **January - February 2005**



## නිරායුද පුරහඳ හා පොහෝ දින මෙහෙයුම

(උඳුවප් පොහෝ දින මුහුද ගොඩ ගලයි - පුවතක්)

සටන් විරාමයට..... විරාමයක්!
නිරායුද භූමියට එරෙහිව
යුද්ධ ප්‍රකාශ කළා
යුදවාදී මහ මුහුද.....
සාම සාකච්ඡා නොතකාම
ආක්‍රමණශීලී මෙහෙයුමක්
සිවුදිගින් එක්වරම.....
අවබෝධතා ගිවිසුම අහෝසියි!


අන්තර් පාලන යෝජනා නොසැලකී
උතුරට ගොඩ ගැලුවා දමිළ මළමිනී.....
නිජභූමි සංකල්ප අත්හැරී
නැගෙනහිරින් මතුවුණා මුසල්මාණු
මළකඳන්.....
නොබෙදුණු රාජ්‍යයක් අහෝසි වී
දකුණින් හමු වුණා සිහලුන්ගෙ මිනී කඳු.....
යුද්ධයේ හැටි ඔහොමමයි!

වෙනසකින් තොරව
හැමතැනම,
හැමවිටම
උපදවන්නෙ එක වගේ මළමිනී!

ත්‍රස්තවාදී සයුර දෙසත්,
අවතැන් වූ රාජ්‍යය දෙසත්,
ඒකීය රටක ගොඩගැසුණු මිනී කඳු දෙසත්
ස්වයං තීරණ අයිතියක් නැති
පුරහඳක්
බලාසිටියා අඳුරේම
කම්පාවෙන්.....

පහසුකම් සපයන්නාගේ භූමිකාවෙන්ද
ඉවත්වී.....
දේශපාලනික විසඳුමක්!

ඉන්දික උඩුගම්පොළ



# ජීවිතය මුහුද සහ මරණය

වැටකේ පඳුරු පොල් රුප්පාහෙවන් යට
සුදු වැලි තලා රත් පැහැ විය අසුරු සැණ
උදුරා ලක්මවගෙ හදවත එක් පැහැර
දෙදරා මහ පොළොව සිදු ගොස නැගිණි නුඹ

වේලක් අතැර වේලක් හෝ කුස පුරවා
අපේ පැටවුනුත් නුඹටම පෙම් බැන්දා
මේ ගිරි දුදුල ළඟ වෙර වීරිය කැන්දා
මෙතුවක් අප සුසුම් නුඹ දෝතින් සින්දා

දිදී ඉසුරු ආසිරි පැන් ඉසිමින්නේ
මේ දිවි කතර නුඹමයි පිහිටට උන්නේ
නුඹේ දරුවන්ය අපි සමුදුරු අම්මේ
අනේ අපට ඇයි සැහැසිව ගියෙ අම්මේ

දිදී කිරි සිනා වෙරළත හැපුණු නුඹ
අපේ කිරි සිනා පැටවුන් රැගෙන සැණ
අඳෝනා දිදී දියඹට ඇදී ගිය
මෙසා ගිනි ඉහිලුමට අප රැකුණෙ කිම

ඇඳිවත පමණක්ම තබමින් අපට හිමී
නුඹ කළ මහ විපත හමුවේ කඳුළු බිබී
තබනට දොසක් සිත නොනැමේ සිදු මවිනී
ජීවිතයටත් විවරණ ඔබ දුන් බැවිනී

සුනන්දා රණසිංහ

# Tsunami

Disasters, Unbelievable, Sorrow
What can I say?
Time for mourning the dead
All of us; in our own way.
The lives that were lost
Families ripped apart,
The global grief of millions
Have now: to play their part.
In sorrow we can all give
The grief we understand,
Time for us to stand up
And give a helping hand.
Each day the numbers grow,
Tomorrow with renewed faith
Life will begin to flow.
A flower in the fields of death
Will suddenly appear,
Men working all together
In friendship shed tear..
In the midst of all your sorrow
As you stand side by side and weep,
Look for the morning sunrise
Memories of them, you keep.

**Ian McCrae Sydney, Australia 2005**



## කල්ප විනාශය

සුර ගඟට සෙනෙහසින
පෙම් වැඩූ ඔය දෑත
කෙලෙස දසමර විලස
රට නොරට කළේ අද

සසල නල බල සිරිත
හද බඳින සිනා රළ
කෙලෙස රළු පරළු ලෙස
මිහිමඬල වැනසුවෙද

සත් පබළු කිරි කවඩි
මල් පිපුණු පුලින තල
මිනිස් කැල හප කරන
සෝර මරු කතර විද

මුදු සුවඳ රළ දෙතොල
වළඳිනා වෙරළ මුව
ලේ උරන හප කරන
වියරු රකුසෙකුවීද?

ගත දොවන නල සුවඳ
සපිරි මේ සිනිඳු බිම
යම කැලට දොළ පුදන
අමු සොහොන වී කෙලෙස

සිනා කැන් මුව පිරුණ
රළ අතින් අඬ ගසන
පිය සෙනෙහෙ මරා ගෙන
යක් සෙනඟ පැමිණියෙද
දෙසම අවමඟුල් කොට
නෙත් පියන කන් වසන

ලෝ නසන හද දවන
කල්පයේ විනාශය
නුඹම වෙද සිලිලාර

ප්‍රීති බණ්ඩාර ධනපාල

## පසුවදනක්!

තැලී පොඩිවී රිදුණු
බිං තඹුරු වැල් අගත්
මල් කැකුළු

රිදී රතුවී සිටින
මුත් හැඩයි
උදෑසන නැගෙන හිරු

රැයේ හැඬූ මුත් උදේ
බලන් මේ හිනා වෙන
පිණි කඳුළු

තිබූ දේ නැතත් තව
බොහෝ දේ ඇත අපට
හිනා වෙමු.

ඉසුරු චාමර සෝමවීර

## මහ සයුර නුඹට දැන් සතුටු ද?

උන් හිටි ගමන් උරණව
කුරිරු වූ රළ පෙළ
යක්ෂාවේෂයෙන් වගේ
අවතැන් කළා මහ පොළව

ඇඳිවතටත් අහිමිව
හඬන දොඩන මහ දන
කළාද කුමන පවක්
මේ හැටිම පළිගන්නට

මැදියම රෑ සොහොනකි
පුංචි සිරිලක අද
කඳුළටත් දුක වැඩිය
හඬන්නටවත් බැරි තරමට

දස දහසක් ජීවිත
නැති භංග කර මහ මුහුද
කාගෙන් නම් පළිගත්තද?
කාට නම් දඬුවම් දුන්නද?

නිබඳ හඬන ලක්මව
මරණාසන්න කර තව තව
වියරු වෙසින් හිනැහෙන
මහ සයුර දැන් සතුටුද?

ජගත් චන්දන අධිකාරි

## හුස්ම

'හුස්ම හුළඟේ ගියා
නැගී රළ පෙළ හුස්ම ගත්දී

මුව සිප සොඳුරු වෙරළේ
දියඹට ගියා උඹ හරි නිසලයි
දියත සසලයි කඳුළු දැන් නෑ

හුස්ම හුළඟේ ගියා
නැගී රළ පෙළ හුස්ම ගත්දී

තන කිරි අහිමි කිරි කැටි බෝමයි
උන් බඩ සා පිපාසෙනී
ආලේ කළ අපට, උඹ කළ ලීලේ
හුස්ම හුළඟේ ගියා
නැගී රළ පෙළ හුස්ම ගත්දී

සිප් කළ දරු අත අකුරු දැන් නෑ
හිමිකම් සැනින, අහිමි කළ හීතල සෙනේ
උඹ කළ විකුම, ගියේ පණ නළ අපේ

**ශාන්ත කුමාර අපොන්සු**

## නපුරු සයුරු රළ

නංගි දැක්කෙ මුතු මුහුදයි
තාලෙට නැළවුණ පැද්දුන
ඒ හින්දයි හිනා වුණෙත්
හාද වුණෙත් රළ සමඟින

ගෙදරට ආ දා දැක්කා
මුහුදේ රුව පෙර නොපෙනුණ
නංගිත් හරියට ඇඬුවා
හදවත නැති රළු රළ ගැන

කැමැත්ත දුන් නැති හින්දා
ගියාට ඇය උදුරාගෙන
බලන් මුහුද අපේ කඳුළු
තව මුහුදකි නුඹ පරදන

**දිලිනි අයේෂා සුබසිංහ**
**කොළඹ විශ්වවිද්‍යාලය**

## මරණය ගලා ගෙන ආවේ....

උදෑසන අසිරිය
අහා බලනු මැන
උදෑසන අසිරිය අති සුන්දර
අලුත් ඉරක් ද මේ පායන්නේ
වැහි ලිහිණියන් ද මේ පියඹ යන්නේ

දුටුවා ද යමක්
අසිරිය දුටු ඒ දෑසින්ම
දැකිමට නොපැතූ නොසිතූ

රැල්ල පැගූ සිඟිති දෙපතුල
කිති කව කවා සිනහ නැංවූ
සිනිඳු සුදු මුදු ජල රැළිද මේ
මරණය වී ගලා ගෙන එන්නේ
අතහැර ගියත් සිඟිති අත පොඩිවුන්ගේ
කිසිදා අත හැරී යාවිද හදවතින්
බියෙන් වික්ෂිප්ත වූ මුව පොඩිත්ත
අම්මේ යැයි හඬමින්ම ගසා ගෙන ගිය

**අනුර හැගොඩ...**

## ලංකා

| | |
|---|---|
| ඉන්දි මහ සයුරේ යටි කොනට | වන |
| පතුරා සම්බුදුගේ සදහම් සුවයෙ | අන |
| වෙසෙන දනන් හට සුව් සැප මිහිරි | දෙන |
| සිරිලක රටකි පෙර සිට ලොව බබල | වන |
| රටවටකොට ඇති නිල්වන් | සාගරයයි |
| රන් කෙත් වන ගංගා ජන | ආදරයයි |
| කඳුවැටි මැද බැබළෙන මිණි | ආකරයයි |
| සතුටින් රටට ඉර හඳ හොඳ හැටි | පායයි |
| ජාතිය මුල තබා තව කෙනෙකුට | ගහන |
| ආගම මුලට ගෙන අනෙකා හට | රවන |
| නොමිනිස් මිනිස් ගති කිසිදා යට | නොවන |
| දෙවියන් විසින් දුන් දඬුවම මද | නොවන |
| ඇරැනිද දෙඇස් වැසියනි දැන්වත් | අධම |
| සාමය සමාදානය ගෙන එනු | නවම |
| අතහැර ජාති ආගම් ධන බල | සිතුම |
| එක් වූ දිනෙක සිදුවෙයි ලක ගොඩ | ගැනිම |

**සුපුන් විජේතුංග**
**මෙට්‍රොපොලිටන් විශ්වවිද්‍යාලය**


## ලන්ඩන් කවි

සංස්කාරක - අනුර හැගොඩ
**Editor -** Anura Hegoda
සංස්කරණ සහය - යසිරු සමරකෝන්
මලිත් හැගොඩ
අනෝමලී - අනුත්තරා
**Editorial - Assistance** Yasiru Samarakoon
Malith Hegoda
Anomali - Anuthara
වෙබ් අඩවි නිපැයුම - කසුන් පලන්සූරිය
**Web Design** - Kasun Palansuriya


මීළඟ කලාපය සඳහා
ඔබගේ නිර්මාණ
ලන්ඩන් කවි
**2 Queens Parade**
**London N8 ORD**
වෙත යොමු කරන්න.

# පලවමු රකුසන්.....

(නව වසරේ ප්‍රාර්ථනාවක්)
මහ සයුරු පත්ල බිඳ
කුපිත කරවූ ඒ මහා ජල කඳ
මහා මකරුන් දහසකගේ
අයාගත් මුසල මුවින්
ගිල ගත්තෝය
අපේ රට... අපේ දැය...
අපේ සම්පත්....
කුමන පාපයකට දෝ...?
පාපය කොහේදැයි
කොතනදැයි
සොයන්න - විමසන්න
සොයුරු සොයුරියනි.....

කොතෙක් නම් ඉවසන් ද
පංච මහා බල වේගයන්
ආපෝ - තෝජෝ - වායු
පඨවි - ආකාශ නම් වූ....

අපේ නොදැමුනුකම්.....?

සොයන්න - විමසන්න
සොයුරු සොයුරියනි
හද පත්ලෙන්ම

ඇයි ඉවසුවේ අප
නොදොඩා
හීන් කෙඳිරියකින් පවා
අයුතු අකටයුතු
කුරිරු අසංවරකම්
දරුණු භීෂණ
පළිගැනීම්
අපචාර ක්‍රියා
මේ මවුබිමෙහි අපගේ....?

ඇඟ බේරාගෙන
සිටියා නොවේද අප
අද ගොළු බිහිරි අය සේ?

කෝපාවිෂ්ටව
මුව අයාගත් ජලජ මකරුන්
මහා මාරුත
සොයා බැලුවාද නොදනිමි
නියත වරදකරුවන්
පාපිෂ්ඨයන්
මිනිස් වෙස් ගත්
අමනයන්....
මුහුදු මකරුන්
ගිල ගත්තෝය
උන් මුවට හසුවූ සැවොම
දරු දැරියන්
මා පියන්
ගැබිණි මවුවරු පවා....

සොයන්න - විමසන්න
සොයුරු - සොයුරියනි
ඉතිරි - පැතිරි දේ
කොල්ලකන
මාරයින්.....

නොදරු දරුවන් අසරණ වූ
තැත් කරන ඊගෙන යැමට
සිය මෙහෙවර
ලතෙත් නැති
නරුමයින්....

ඇද දමව්
පංච මහා භූතයිනි
එවන් පාපතරයන් ද
අසරණයන් බිලිගත්
මහා සයුරටම.....!


කප් කෙලක් දනන්
දිවා රෑ නොබලා
යෙදී සිටියදී
මහා ගැලවුම්
පුණ්‍ය කර්මයක

මහා කරුණා
සහන සේවා මෙහෙයක
එයත් උදුරත් නම්
රකුස් සම වූ මිනිසුන්
සාගින්නෙන් පෙළෙන
අසරණයින්ගේ මුවින්
තිබේද ඉතිරිව යමක් තවත්
අප හට
හඬගා ලොවට කිවහැකි වූ.....?
සොයන්න - විමසන්න
මිනිසුනි
බලවී හදවත් පාරා
කුමන රකුසන් ද?
නිදන් ව ඉන්නේ....?
පලවා හරිනු මැන මිනිසුනි
සාමයට සමඟියට
සත්භාවයට එරෙහි වූ
එවන් රකුසන්
සිය හදවත් තුළින්

එසේ කළහොත් පමණි
සංසිඳෙන්නේ
පංච මහා බලවේගයන්

බුදු පා සෙවණේ සැදුණු
මිනිසුනේ
දළදා සෙවණේ සැදුණු
මිනිසුනේ
සිරිපා සෙවණේ සැදුණු
මිනිසුනේ
මහ බෝ සෙවණේ සැදුණු
මිනිසුනේ
යේසු ස්වාමි දරුවන්ගේ
දරුවනි
සිව දෙවිඳුන්ගේ වර ලද
දරුවනි
අල්ලා දෙවියන් යදිනා
දරුවනි
ඊශ්වර දෙවියන් අදහන
දරුවනි
නැඟී සිට එකමුතුව
ඇතිව හෝ නැතිව
නායකයින්
සංසිඳවමුද
පංච බල වේගයන්
අපේ එකමුතු ශක්තියෙන්
අපේ යහ ගුණ මහිමයෙන්
අපේ මෙත් කරුණා බෙලෙන්......

**හෙන්රි ජයසේන**



INDIAN OCEAN'S
# TSUNAMIS

The Oceans that girdle us,
Without which we shall surely die,
Are benign, yet malefic,
Beneficient, yet ruthless,
Beautiful, yet sinister.

Disturbances in the earth's TECTONIC PLATE
In the oceanbed occurred, a marine eathquake erupted,
A cataclysmic watery Holocaust ensued.
From its epicentre 30 foot high seismic waves surging at 500mph
devastated coasts near and distant
Soon after, We bury more than a hundred and Seventy thousand bloated dead
One hundred and Seventy thousand individual tragedies
Most wild animals, One - emptying danger, sought higher ground.
(Throw a pebble in a pond and watch the ripples¡
You'll see in miniature what occurred!)
Yet, how could we hate the sun or rain, the wind?
How could we ever hate the wide blue sea?

**Denis Jansz London**

# නැවත නැගීම

රළ බිඳේ ඇසේ හඬමින මහ මුහු ද
කඳවුරෙ රැයේ නොනිදන නිදන ස ඳ
වෙරළතේ හැපේ කියමින වූ වර ද
හිතුමතේ වියරු වී මඟ වැරදිනි ද

ඔරු බඳේ නැගී නුඹ වෙත පැද නිබ ඳ
සරිකළේ මගේ දරුකැළ දුකම ව ද
නුඹ සිතේ අරොව මා ගැන එවරද ද

ආ සඳේ නැගී රුදුරුව පැන පෙර ට
විගසිනේ නැවත පසු බැස ගිය කල ට
වරදිනේ මගේ සොයුරන් සිතු ලෙස ට
රැවටුනේ ඇයිද ගොස් ළංවී නුඹ ට

සුළු නැතේ වරද සිඳු නුඹ කළ අප ට
දෙරණතේ හැපී වැන්දත් විටින් වි ට
නුඹ වතේ අසිරි සිරි විඳ පිට අයට ට
නැත ගතේ කිසිත් රැඳුණේ ගෙන යන් ට

සිඳු රළේ හතක් ආවත් වෙරළ පැ න
මින් රැළේ නොමැති දිවියක් නැත දකි න
වෙර සිතේ නැතේ නුඹ ගැන මෙත් සිති න
හෙට දිනේ නගිමු ඔරුවට අප ඉති න

රධනිකා අතුකෝරල




## ලක් මව ගේ වැලපීම

දියසේන පුතු පහළ වන තුරු
බලා සිටියා මා නැතක් කල්!
වසර දෙදහස් පන්සියක් කල්!

පැළී වළං පැළී
කට ඇරුණු මා උර මඬල
දියෙන් - නිල්වණින් රැලි රැලි නගාවී
නෙළුම් මල් පිපි පිපී තඹරෝර
සතර අත මකරන්ද සුගන්දේ - විදේවී

කිණි කිණි නදින් මිණි මිණි නදින්
බමර තුඩ ගී ඇසේවි
ඒ නදින් පිළිසිඳී වී බිජු
රන් කරල් කිරි වැදී පැසේවි

මහලු පැරකුම් පුතුන් මහසෙන්
පැමිණ දියවර සැදූ සේ
දියසේන පුතු මගෙ සිහිනය
වැව් දියෙන් ගොඩ නගාවී

නැගුණු උඳුවප් සඳ ගෙනාවේ
වඩදියද බා දියද නොවේමැයි
මගේ දරු කැලක මා හොරෙන් පැහැරගත්
මුහුදු දිය ලෙසින් ආ ගිනි කඳම වේමැයි

කොයින් ආ දිය කඳක් දෝ!
කවරනම් ගිනි වැටක් දෝ!
සයුරු දිය නම් නොවේමැයි
මගේ සිහිනය දවා හළු කළ
වළම ගිනි වැට ම වේදෝ

අනුලා විජයරත්න මැණිකේ

## TSUNAMI POEM

A Tsunami Wave swept
them away.
Died in an instant, on
Boxing Day.
Hundreds of thousands of
souls
Gone to water graves.
The young, the sick, the
old.
The rich and the poor,
the beautiful, the brave.
In some cases, everybody.
No one was saved.
The scale of this devasta-
tion
will be with us,
for many a generation.

How can this be?
Natural Disaster!
Their destiny!
How can we come to
terms,
with such awesome trag-
edy?
I guess all we can do, is
try
and help the survivors get
through.
And think ourselves very,
very lucky,
As, there but for the geog-
raphy go we.
Those poor helpless souls
now rest in peace, whilst
the bereaved
remain lost in despair and
grief.

That terrible day they died
will go down in history.
We can hope and we can
pray
they did not suffer badly
that day.
As natures most awesome
power
set against the Indonesian
coastline.
Killing, maiming, bereav-
ing.
Permanently displacing,
in one moment, it did
devour.
Never again should man
take for granted,
the enormity of Nature's
Power!

**ROBERTA WEST**

## Disbelief

A wall of water churns and roars
upon those peaceful, tropic shores
clutching with greedy hand.
Children search
with desperate eyes;
the torrent will not hear their cries,
but sweeps across the land
Powerless, they seek a hiding place
but all are gone
without a trace,
beneath a shroud of sand.
No words
describe our disbelief;
no tears
can stem our silent grief;
we cannot understand.

**Margaret Leith Minter**
**Victoria B. C., Canada**

## මුහුදට සේදුන මතකය

වෙහෙර මහදේවියට නොකියාම
නැගමන් ආ රළු මුහුද
රැගෙන ගිය පිච්ච මල්
විසිර එකිනෙක
ගොඩට පාවිය
ලවණ පැහැයෙන්
නොරිකො සන් එහි ඇත්ද?

පිච්ච මල් ඇස් අරින
මහෝෂද දොරටු අස
විශාලා පුර
රැඳුණ පිච්චමල් අසල
නතර වී සෙව්වෙමි!
නොරිකො සන් එහි නොවුණි!

මොහොතින් මොහොත දිගහැරෙන
රූපවාහිනී ඇහිපිය යට
සුසුමක සරින් සෙව්වෙමි!

ජපානෙට හීනෙකින්වත්
නොගිය
මා සොයන මා සෙවූ
මගේ නොරිකෝ එහි
නොවුණි!
පරණ දිනපොත්
එකින් එක පීරමින්
ක්ලාන්තව කැරකවූ
දුරකතන අංක හැම
ලබ් ඩබ් හඬින් නැවතිණි!
මාතර! මට බොහෝ දුර
උව
ඉඳහිටක
දුරකතන ඇමතුමක් ගෙන
සිනහවෙන් පමණක් කතා
කළ
ඇගේ හඬ
ඉනික්බිති තාම නොඇසුණි

චාලක රණසූරිය



## කිත්මිණි අක්කා....

ලෝ ප්‍රකට GLAXO SMITH KLINE ලන්ඩන් ශාඛාවේ විද්‍යාඥවරියක ලෙස සේවයේ යෙදී සිටිය දී පසුගිය දෙසැම්බර් 26 වැනි දා ශ්‍රී ලංකාවේ ඇති වූ මුහුදු කුණාටුවෙන් මියගිය දහසක් දෙනා අතර 'නන්දිකා කිත්මිණී සිල්වා' මහත්මිය ද විය. ඉතා ප්‍රියජනක මුහුණක් සහ සෙනෙහෙබර ගති පැවතුම්වලින් පිරිපුන් ඇය මට 'දයාබර කිත්මිණී අක්කා' විය.

'ඔබ සතුටින් නොසිටින
සුන්දර කථා නොකියන
වසර ගණනාවක සිට
මම දැක නැත එකදු මොහොතක
..... ඔබෙ සිනහවයි මම දකින්නේ .....

ජීවිතේ ප්‍රශ්න මැද
මා තනි වූ මොහොතක
මගේ දෑතම රැගෙන
ඔබ මා ළඟින් සිටියේ

..... ඔබයි මට සැනසුම ගෙන ආවේ .....
සතුට දී පමණක් නොව
දුකේ දීත් සිනාසෙන්නට
මට කියා දුන්නේත්
යොමු කළෙත්, ඔබයි අක්කේ

..... ඔබේ ඔවදම් මම රකින්නෙමි .....
වසර ගණනක් නොව
ආත්ම ගණනාවක් තිස්සේ
මගේ අක්කා වී
ඔබයි සිටියේ මා අසල

..... ඔබේ උණුසුම මට දැනෙන්නේ .....
මෙවන් දුකකට කිසිම දවසක
පත් නොවන්නට ඉඩ තබා අප
අජරාමර නිවන් සුව
ඔබ ලබනු ඇත, නිසැකව
..... ඇත දිලිසෙන 'තරුව' ඔබ වේ .....

විමල් අලහකෝන් - ලන්ඩන්